සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 62 | S | I |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය :....................................... පුරවැසි අධ්‍යාපනය - I    කාලය: පැය 03යි.

වැදගත් :
- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- ✳ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(1) ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය හැඳින්වූයේ කුමන නමකින් දැයි පිළිතුරු අතරින් තෝරන්න.
1. ප්‍රාදේශීය සභාව
2. පුරවැසි සභාව
3. පළාත් සභාව
4. ගම් සභාව

(2) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ග්‍රීසියේ පෞර රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ පිරිස වන්නේ,
1. නගර වැසි කාන්තාවන් ය.
2. විදේශිකයන් ය
3. නගර වැසි වහලුන් ය.
4. නගර වැසි වැඩිහිටි පිරිමින් ය.

(3) ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ කුමන හේතුවක් මත දැයි පිළිතුරු අතරින් තෝරන්න.
1. එය අන්‍ය මත ගරු කරන නිසා ය.
2. එය සමානාත්මතාවය ගරු කරන නිසා ය.
3. එමගින් සාකච්ඡා කර තීරණ වලට එළඹෙන නිසා ය.
4. එය මහජන කැමැත්ත මත සිදුවන නිසා ය.

(4) ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය බලයට අයත්වන බලතල තුන ඇතුළත් පිළිතුර තෝරන්න.
1. පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය
2. පාලන බලතල, මූලික අයිතිවාසිකම්, මූලික යුතුකම්
3. පාලන බලතල, මූලික අයිතිවාසිකම්, නිදහස
4. පාලන බලතල, මූලික අයිතිවාසිකම්, සමානාත්මතාවය

(5) ඒක පක්ෂ ක්‍රමයක් පමණක් පවතින රටවල් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. චීනය, කියුබාව
2. චීනය ඇමරිකාව
3. කියුබාව, ශ්‍රී ලංකාව
4. ඉන්දියාව, එංගලන්තය

(6) තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයක් වන්නේ,
1. ජනමතය නියෝජනයට ඇති ඉඩකඩ ඉතා සීමිත වීමයි.
2. අත්තනෝමතික පාලනයක් බිහි වීමයි.
3. බහුවිධතාවය තුළින් එක්සත් බව ගොඩනැගීම යි.
4. ආණ්ඩු පක්ෂයේ හිතකර ප්‍රතිපත්ති විවේචනය කිරීම යි.

(7) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථක කරගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටු විය යුතු කාර්යයක් වන්නේ මින් කුමක් ද?

1. ආණ්ඩු පක්ෂයේ සෑම ක්‍රියාකාරකමක් ම විවේචනය කිරීම
2. ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්ති වලට සහයෝගය දැක්වීම.
3. ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරකම් ගැන සොයා බලා සංවර්ධනාත්මකව විවේචනය කිරීම.
4. ආණ්ඩු පක්ෂයේ සෑම ක්‍රියාකාරකමක් ම අනුමත කිරීම.

(8) මිනිසාට තම සමාජ ජීවිතය පරිපූර්ණ කර ගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම හඳුන්වනු ලබන්නේ,

1. නිදහස ලෙසයි
2. අයිතිවාසිකම් ලෙසයි
3. සිවිල් අයිතිවාසිකම් ලෙසයි
4. සමානාත්මතාවය ලෙසයි

(9) ප්‍රජාතන්ත්‍රවාදී රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ මින් කුමක් ද?

1. පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම.
2. පුරවැසි අයිතිවාසිකම් පිළිබඳව පාලකයා හා පාලිත දෙපක්ෂයම දැනුවත් වීම.
3. පාලකයන් අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීමට පෙළඹීම.
4. නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම.

(10) රටක නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණයක් වන්නේ,

1. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා වීමයි.
2. සැවොම නීතිය අභිබවා යාම යි.
3. නීතියේ රැකවරණය සුවිශේෂ පුද්ගලයන්ට හිමිවීමයි.
4. අතීතයට බලපාන පරිදි වරදකරුවන්ට දඬුවම් ලබාදීමයි.

(11) ''ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් මිනිසුන් එකට එක් වී පිහිටුවා ගත් සංවිධානය රාජ්‍යවේ.'' මෙම ප්‍රකාශය ඉදිරිපත් කළේ,

1. මහාචාර්ය ගානර් ය.
2. G. D. H. කෝල්ය
3. ඒබ්‍රහම් ලින්කන් ය
4. ඇරිස්ටෝටල් ය.

(12) යුරෝපයේ ජාතික රාජ්‍ය බිහි වීමට බලපෑ හේතුවක් වන්නේ, මින් කුමක් ද?

1. දියුණු ආර්ථික තත්ත්වයන් පැවතීම
2. යුද හා නාවික ශක්තිය තිබීම
3. ධනවාදී ආර්ථිකයක් ගොඩ නැගීම
4. ජාතීන් සතු වූ නිර්මාණශීලී හැකියාව

(13) පහත ''අ'' තීරුවේ සඳහන් වගන්ති ''ආ'' තීරුවේ ඇති වගන්ති සමග නිවැරදිව ගළපන ලද පිළිතුර තෝරන්න.

| | (අ) තීරුව | | (ආ) තීරුව |
|---|---|---|---|
| 1. | ස්විස්ටර්ලන්තය | A. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පිහිටුවා ඇත. |
| 2. | නීතියේ ආධිපත්‍යය | B. | රටක සියල්ලට ම ඉහලින් මෙය පැවතිය යුතු ය. |
| 3. | අධිකරණයේ ස්වාධීනත්වය | C. | අපක්ෂපාතී අධිකරණයක පැවැත්ම යුක්තිය හා සාධාරණත්වය අගයන නීතිගරුක සමාජයන් ගොඩනැගීමට මහෝපකාරී වේ. |
| 4. | පළාත් සභා පිහිටුවීම | D. | මෙම රාජ්‍යයේ ප්‍රාන්ත හඳුන්වනු ලබන්නේ ''කැන්ටන්'' යන සුවිශේෂී නමිනි. |

1. DBCA  2. DBAC  3. ABCD  4. BADC

(14) ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නංවන ආයතනය මින් කුමක් ද?

1. ව්‍යවස්ථාදායකය
2. පාර්ලිමේන්තුව
3. ජනාධිපති ඇතුළු කැබිනට් මණ්ඩලය
4. අධිකරණය

(15) පහත සඳහන් වගන්ති වලින් පුරවැසියා විසින් තම රාජ්‍යයට ඉටු කළ යුතු වගකීමක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. නීතිය හා සාමය ආරක්ෂා කිරීම
2. රටේ සම්පත් සාධාරණව බෙදී යන පරිදි කටයුතු කිරීම
3. තම රැකියාව හෘදය සාක්ෂියට අනුව නොපිරිහෙලා ඉටු කිරීම
4. පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කිරීම

(16) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථකවීමට අවශ්‍ය සාධකයක් වන්නේ,

1. යහපත් ආර්ථික මට්ටමක් පැවතීම
2. ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් තිබීම
3. තරඟකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම
4. සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ආණ්ඩු හා පාලකයන් තෝරා ගැනීම.

(17) ප්‍රජාතන්ත්‍රවාදී රටක පාලනයට පුරවැසියෙකුට සහභාගී වීමට ලැබෙන අවස්ථාවක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. තමන් කැමති පක්ෂයකට බැඳී කටයුතු කිරීමට හැකිවීම.
2. වෘත්තිය සමිතිවල කටයුතු කිරීමට හැකිවීම
3. මැතිවරණයකදී ඡන්ද අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීමට අවස්ථාව ලැබීම.
4. ආණ්ඩුව විවේචනය කිරීමට අවස්ථාවක් ලැබීම.

* පහත තොරතුරු ඇසුරින් 18 හා 19 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

A. මධ්‍යම ආණ්ඩුව විසින් සම්මත කරන පනතක් මගින් බලය පවරා ඇත.
B. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් බලය බෙදා ඇත.
C. ප්‍රාදේශීය පාලන ඒකක වලට හිමි බලතල අවශ්‍ය ඕනෑම විටක මධ්‍යම ආණ්ඩුවට පවරා ගත හැකිවීම.
D. ප්‍රාදේශීය පාලනය පළාත් පාලන ආයතන හරහා සිදු කිරීම.
E. ප්‍රාදේශීය පාලනය ප්‍රාන්ත ආණ්ඩු හරහා සිදු කිරීම.
F. ප්‍රාදේශීය පාලන ඒකකවලට හිමි බලතල ඕනෑම විටෙක පහසුවෙන් මධ්‍යම ආණ්ඩුවට පවරා ගත නොහැක.

(18) බලය විමධ්‍යගත කිරීමට අදාලවන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1. ABC 2. ACD 3. BCD 4. DEF

(19) බලය බෙදා හැරීමට අදාලවන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1. ABC 2. ACD 3. BEF 4. BCD

(20) ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කිරීම නිවැරදිව පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.

1. අමාත්‍යාංශ ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී, දිස්ත්‍රික් ලේකම්
2. අමාත්‍යාංශ ලේකම්, ග්‍රාම නිලධාරී, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්
3. අමාත්‍යාංශ ලේකම්, දිස්ත්‍රික් ලේකම්, ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම්
4. අමාත්‍යාංශ ලේකම්, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී

(21) නූතන සන්ධීය රාජ්‍යයක නව ප්‍රවණතාවයක් ලෙස දැක්විය හැකි පිළිතුර තෝරන්න.

1. සියළු ජන කොටස් පොදු හැඟීමෙන් යුතුව කටයුතු කිරීම.
2. මූල්‍ය සම්පත් සාධාරණ ලෙස ප්‍රාන්ත ආණ්ඩු වෙත ලබාදීම.
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කරන අවස්ථා වල මධ්‍යම ආණ්ඩුවට වාසි සහගත වන ලෙස සිදු කිරීම.
4. රාජ්‍යයේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම.

* **පහත වගන්ති ඇසුරින් 22 හා 23 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

A. නීති පැනවීම පිළිබඳ උත්තරීතර බලය මධ්‍යම ආණ්ඩුවට හිමි ය.
B පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා පළාත් පාලන ආයතනවලට බලය විමධ්‍යගත කර ඇත.
C රාජ්‍ය බල අධිකාරය ප්‍රාන්ත හා මධ්‍යම ආණ්ඩුව අතර බෙදා ඇත.
D විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟාකර ගැනීමට මග පාදයි.
E රාජ්‍යයේ ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුවට ඒකරාශි වී ඇත.
F තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක ය.

(22) ඒකීය ආණ්ඩුක්‍රමයට අයත්වන වගන්ති ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

1. ABC 2. BCD 3. CDE 4. ABE

(23) සංධීය ආණ්ඩුක්‍රමයට අදාල පිළිතුරු කාණ්ඩය වන්නේ,

1. CDF 2. ABE 3. ABC 4. BCD

(24) ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ පාලන ක්‍රම වල පවා බලය විමධ්‍යගතව පැවති බවට උදාහරණ පහත පිළිතුරු අතරින් තෝරන්න.

1. ඇතැන්ස් පෞර රාජ්‍යයේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
2. ක්‍රි. පූ. 6 වන ශතවර්ෂයේ වජ්ජි සමූහාණ්ඩු පාලනය
3. ඉන්දියාවේ ප්‍රාදේශීය පාලනය ප්‍රාදේශීය රජවරුන් විසින් රැගෙන යාම.
4. පොළොන්රු යුගයේ මහා පරාක්‍රමබාහු රජු විසින් ප්‍රාදේශීය පාලකයන් පත් කිරීම.

(25) 1865 මහනගර සභා ආඥාපනත මගින් පිහිටුවන ලද මුල් ම මහනගර සභා දෙක වන්නේ,

1. කොළඹ හා මහනුවර මහ නගර සභා ය.
2. කොළඹ හා ගාල්ල මහ නගර සභා ය.
3. මහනුවර හා ගාල්ල මහ නගර සභා ය.
4. කොළඹ හා යාපනය මහ නගර සභා ය.

(26) බලය විමධ්‍යගත කිරීම යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභා පිහිටුවන ලද්දේ කුමන පනත මගින් ද?

1. 1987 අංක 15 දරණ පාර්ලිමේන්තු පනත මගින්
2. 1987 අංක 42 දරණ පාර්ලිමේන්තු පනත මගින්
3. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින්
4. 1978 ව්‍යවස්ථාව 154 (අ) ව්‍යවස්ථාව මගින්

(27) සෑම පළාත් සභාවකම මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදුකරන නියෝජිතයා වන්නේ,

1. මහ ඇමති වරයා ය. 2. ජනාධිපති වරයා ය.
3. පළාත් ආණ්ඩුකරුය. 4. කථානායකවරයා ය.

(28) පළාත් ආණ්ඩුකරු ධූරයෙන් ඉවත් කිරීමේ ක්‍රියාදාමය වන්නේ,

1. පළාත් සභා මන්ත්‍රීවරු විසින් 2/3 ක බහුතරයකින් සම්මත කරන යෝජනාවක් ජනාධිපතිට ඉදිරිපත් කිරීමෙනි.
2. පළාත් සභාවේ 1/2 ක බහුතරයකින් සම්මත කරන යෝජනාවක් ජනාධිපතිට ඉදිරිපත් කිරීමෙනි.
3. ජනාධිපතිවරයා විසිනි.
4. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන යෝජනාවක් මගින් ජනාධිපතිවරයා විසිනි.

(29) ඕනෑම පළාත් සභාවක මහ ඇමතිවරයා පත් කරනු ලබන්නේ,

1. ජනාධිපති උපදෙස් මත ආණ්ඩුකරු විසිනි
2. පළාත් සභාවේ බහුතර සහය ලැබෙන තැනැත්තා ආණ්ඩුකරු විසිනි.
3. ජනාධිපතිවරයා විසින් ආණ්ඩුකරුගේ උපදෙස් මතය
4. පළාත් සභාවේ ජනප්‍රියම පුද්ගලයා ජනාධිපති වරයා විසිනි

(30) පළාත් පාලන ආයතන ප්‍රධානීන් තිදෙනා පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. නගරාධිපති, සභාපති, සභාපති
2. මහ ඇමති, නගරාධිපති, සභාපති
3. මහ ඇමති, උපනගරාධිපති, සභාපති
4. මහ ඇමති, සභාපති, සභාපති

(31) පළාත් සභාවක සිටිය යුතු මංත්‍රීන් සංඛ්‍යාව තීරණය කරනු ලබන ප්‍රධාන සාධක දෙක වන්නේ,

1. ජන ඝණත්වය හා පළාතේ සංවර්ධන මට්ටමයි.
2. ජනගහනය හා පළාතේ සංවර්ධන මට්ටමයි
3. ජනගහනය හා පළාතේ වර්ග ප්‍රමාණයයි.
4. වර්ග ප්‍රමාණය හා පළාතේ ඇති සම්පත් ප්‍රමාණයයි

* ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු බලතල ඇසුරින් 32 හා 33 ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

- A බදු පැනවීම හා එක්රැස් කිරීම
- B අධ්‍යාපනය
- C සෞඛ්‍ය
- D නිවාස හා ඉදිකිරීම්
- E මූල්‍ය කටයුතු
- F ජාතික ආරක්ෂාව
- G ජාතික ආර්ථිකය සංවර්ධනය
- H පළාත් පාලනය මහා මාර්ග

(32) මධ්‍යම ආණ්ඩුව සතු බලතල ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1. AEFG 2. ABCD 3. EFGH 4. BCDH

(33) ප්‍රාන්ත ආණ්ඩුව සතු බලතල ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1. AEFG 2. ABCD 3. EFGH 4. BCDH

(34) ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත අතර බලය බෙදා හැර ඇති ආකාරය ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. මධ්‍යම ආණ්ඩුවේ බලතල ප්‍රාන්ත සතු බලතල හා දෙකටම හිමි බලතල ලෙස වෙන් කිරීම
2. මුලින්ම ප්‍රාන්ත ආණ්ඩුවලට හිමි බලතල ප්‍රකාශ කර ඉතිරි බලතල මධ්‍යම ආණ්ඩුවට වෙන් කිරීම
3. මධ්‍යම ආණ්ඩුවේ බලතල පමණක් ව්‍යවස්ථාවට ඇතුළත් කර ඉතිරි බලතල ප්‍රාන්තවලට පැවරීම
4. මධ්‍යම ආණ්ඩුව සතු බලතල ප්‍රාන්ත සතු බලතල ලෙස වෙන් කිරීම.

(35) ස්විස්ටර්ලන්තයේ සංධීය ආණ්ඩු ක්‍රමයට අනුව ඒ රටේ ව්‍යවස්ථාදායකය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

1. සංධීය මහා මණ්ඩලය නමිනි
2. පාර්ලිමේන්තුව නමිනි
3. කොංග්‍රසය නමිනි
4. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය නමිනි.

(36) ''සංස්කෘතිය'' යන්නට නිර්වචන සැපයූ දාර්ශනිකයන් දෙදෙනෙක් වන්නේ,

1. T. B. ටයිලර් හා ඒබ්‍රහම් ලින්කන් ය .
2. සීලර් හා හිලර් ය.
3. T. B. ටයිලර් හා E. T. හිලර් ය.
4. ඇරිස්ටෝටල් හා චාර්ල්ස් ඒ එල්වුඩ් ය.

(37) සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපෑ හේතුවක් වන්නේ,

1. අල්ලස හා දූෂණය පහළ යාමයි.
2. රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමතාවයයි
3. රාජ්‍ය සේවයට දේශපාලනය මැදිහත් නොවීමයි
4. රාජ්‍ය පාලකයන් වගකීමෙන් යුතුව කටයුතු කිරීමයි.

(38) වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග දෙකක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. බෞද්ධ, සිංහල
2. හින්දු, දෙමළ
3. ඉස්ලාම්, මුස්ලිම්
4. බර්ගර්, මැලේ

(39) රටක යහපාලනය සඳහා අවශ්‍යවන දේශපාලන යහගුණයක් වන්නේ මින් කවරක් ද?

1. තමන් කැමති නීත්‍යානුකූල වෘත්තියක හෝ ව්‍යාපාරයක නිරතවීම.
2. එකිනෙකාගේ දේශපාලන අනන්‍යතාවයට ගරු කිරීම
3. කැමති ආගමක් ඇදහීම
4. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම

(40) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සංක්‍රමන සණයට අයත් සාධකයක් වන්නේ,

1. විජය ඇතුළු පිරිස පැමිණීම යි.
2. පණ්ඩු පාරින්ද ඇතුළු පිරිසගේ පැමිණීම යි.
3. කාලිංග මාඝ ආක්‍රමණයයි.
4. බටහිර යුරෝපා ජාතීන්ගේ පැමිණීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

62 | S | II

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
# Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය :........................................ පුරවැසි අධ්‍යාපනය - II

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

(1) (i) සප්ත අපරිහානීය ධර්ම 2 ක් ලියන්න.

(ii) ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප 2 ක ලියන්න.

(iii) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පැවැත්ම සඳහා නිදහස් ජන මාධ්‍ය මගින් ඉටුකරන කාර්යයන් 2 ක් ලියන්න.

(iv) රාජ්‍යයක මූලික ලක්ෂණ 2 ක් නම් කරන්න.

(v) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ 2 ක් ලියන්න.

(vi) නූතන ජාතික රාජ්‍යය පුරවැසියන් උදෙසා ඉටු කරනු ලබන කාර්යයන් 2 ක් ලියා දක්වන්න.

(vii) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය පාලන ඒකක අතර බලය බෙදා ඇති ආකාරය සැලකිල්ලට ගෙන රාජ්‍යයන් වර්ගකළ හැකි ආකාර 2 ක ලියන්න.

(viii) යුතුකම් බෙදෙන ප්‍රධාන කොටස් 2 ක ලියන්න.

(ix) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජක් වීම කෙරෙහි පිහිටීම යන සාධකය බලපෑවේය. ශ්‍රී ලංකාවේ පිහිටීමේ සුවිශේෂතා 2 ක් ලියන්න.

(x) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පළාත් පාලන ආයතන 2 ක් නම් කරන්න.

(ලකුණු 20)

(2) ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් යහපත් පාලන ක්‍රමයක් ලෙස ලෝකයේ පිළිගැනීමට ලක් වී ඇත.

(i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඒබ්‍රහම් ලින්කන් විසින් ඉදිරිපත් කළ නිර්වචනය ලියන්න. (ල. 02)

(ii) පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු 3 ක් ලියන්න. (ල. 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී රටවල ක්‍රියාත්මක වන පක්ෂ ක්‍රමයේ ස්වරූප තුන ලියා එකක් උදාහරණ සහිත ව විස්තර කරන්න. (ල. 05)

(3) රාජ්‍යයක කැමැත්ත හා මහජන අපේක්ෂා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නංවන නියෝජිතයා වන්නේ ආණ්ඩුවයි

(i) නූතන රාජ්‍යවල විධායක බලය ක්‍රියාවට නන්වන්නේ කව්ද? යන පැනයට අනුව බෙදෙන ප්‍රධාන ආණ්ඩුක්‍රම වර්ග 2 ක නම් කරන්න. (ල. 02)

(ii) ඉහත පිළිතුරෙහි සඳහන් ඔබ කැමති ආණ්ඩුක්‍රම වර්ගයක ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

(iii) ආණ්ඩුවක ප්‍රධාන ආයතන තුන දක්වා ඒ එකක කාර්යයන් දෙක බැගින් ලියන්න. (ල. 05)

(4) බලයේ අවසාන හිමිකරුවා වන්නේ මහජනතාවයි. එම බලය ජනතා පරමාධිපත්‍ය ලෙස හඳුන්වයි.

(i) බලය විමධ්‍යගත කිරීම හඳුන්වන්න. (ල. 02)

(ii) බලයේ විවිධ ස්වරූප පවතී. එම ස්වරූප 3 ක් ලියන්න. (ල. 03)

(iii) ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍ය බලයට අයත්වන කොටස් තුන ලියා එකක් විස්තර කරන්න. (ල. 05)

(5) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පාලකයන් තෝරා ගන්නේ සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන පැවැත්වෙන මැතිවරණ මගිනි.

(i) නිදහස් හා සාධාරණ මැතිවරණයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 02)

(ii) නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් දක්වන්න. (ල. 03)

(iii) (A) ප්‍රජාතන්ත්‍රවාදී රටක ඡන්ද දායකයකු සතු අයිතිවාසිකම් 3 ක් ලියන්න. (ල. 03)

(B) ප්‍රජාතන්ත්‍රවාදී රටක ඡන්ද දායකයකු විසින් ඉටු කළ යුතු යුතුකම් 2 ක් ලියන්න. (ල. 02)

(6) බහු සංස්කෘතික සමාජයක සාමකාමීව ජීවත්වීමට අවශ්‍ය නිපුණතාවලින් පිරිපුන් පුරවැසියන් පිරිසක් බිහිවිය යුතුය.

(i) ලෝකයේ ඕනෑම සංස්කෘතියකට අයත්වන අංග 2 ක් ලියන්න. (ල. 02)

(ii) බහු සංස්කෘතික ජන සමාජයක මූලික ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

(iii) බහු සංස්කෘතික ජන සමාජයක එක්සත්ව ජීවත් වීමේ වැදගත්කම පිළිබඳව කරුණු 3 ක් ශ්‍රී ලංකාව ඇසුරින් ලියා එකක් විස්තර කරන්න. (ල. 05)

(7) (i) යහපාලනයක මූලික ගුණාංග 2 ක් ලියන්න. (ල. 02)

(ii) බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන වාසි තුනක් ලියන්න. (ල. 03)

(iii) බහු සංස්කෘතික ජන සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියෙකු ලෙස ප්‍රගුණ කළ යුතු ගුණාංග 3 ක් ලියා එකක් විස්තර කරන්න. (ල. 05)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

62 S I II

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

## පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 4 | 21 | 3 | 31 | 3 |
| 2 | 4 | 12 | 3 | 22 | 4 | 32 | 1 |
| 3 | 4 | 13 | 1 | 23 | 1 | 33 | 4 |
| 4 | 1 | 14 | 2 | 24 | 4 | 34 | 3 |
| 5 | 1 | 15 | 2 | 25 | 1 | 35 | 1 |
| 6 | 3 | 16 | 1 | 26 | 1 | 36 | 3 |
| 7 | 3 | 17 | 3 | 27 | 3 | 37 | 2 |
| 8 | 2 | 18 | 2 | 28 | 1 | 38 | 4 |
| 9 | 3 | 19 | 3 | 29 | 2 | 39 | 2 |
| 10 | 1 | 20 | 4 | 30 | 1 | 40 | 1 |

### II පත්‍රය

(1) (i) * නිතර රැස්වී සාකච්ඡා කිරීම.
* සමගිව රැස් වී, සාකච්ඡා කර, සමගිව විසිරයාම
* නොපැනවූ නීති නොපැනවීම පැනවූ නීති ක්‍රියාත්මක කිරීම....

(ii) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය
වක්‍ර / නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය

(iii) * සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාවට සැපයීම
* ජනතාවගේ දුක්ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමු කිරීම
* ජනතාවගේ දැනුම වර්ධනය කිරීම (පි. 15)

(iv) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපතිත්වය

(v) * එක් ජාතියක් එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම.
* භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය යන අංගවලින් සමන්විත වීම.
* වෘත්තීය නිලබල පැලැන්තියක් මගින් පාලන බලය මෙහෙයවීම
* අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධයෙන් ස්වාධිපති බලය හිමිවීම.

(vi) * නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
* සමාජ සුභ සාධක සේවා සැපයීම
* දිළිඳුකම පිටු දැකීම

(vii) ඒකීය / සන්ධීය

(viii) නීතිමය / සදාචාරාත්මක

(ix) * භූගෝලීය පිහිටීම
* ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම
* ඉන්දියාවට ආසන්නව පිහිටීම
* පෙර අපර දෙදිග වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස පිහිටීම.

(x) මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා

(2) (i) ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වාගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයයි.

(ii) * වර්තමාන රාජ්‍යවල භූමි ප්‍රමාණය විශාලවීම.
* වර්තමාන රාජ්‍ය අධික ජනගහනයකින් යුක්තවීම.
* සියළු පුරවැසියන් එක් ස්ථානයකට රැස්කිරීමේ අපහසුව.
* සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.

(iii) ඒක / ද්වි / බහු,
උදාහරණ:- කියුබාව, චීනය /
ඇමරිකාව, බ්‍රිතාන්‍ය, ශ්‍රී ලංකාව /
ප්‍රංශය

(3) (i) ජනාධිපති / කැබිනට් (පාර්ලිමේන්තු)

(ii) <u>**පාර්ලිමෙන්තු කැබිනට් ආණ්ඩු ක්‍රමයයේ ලක්ෂණ**</u>
* විධායකය නාමික හා සත්‍ය ලෙස කොටස් 2 කි.
* ව්‍යවස්ථාදායකය තුළින් විධායකය පත්වේ.
* ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඇති ඍජු සබඳතාව
* විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකිය.

<u>**ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ**</u>
* විධායකය බලය ජනාධිපති හසුරුවයි.
* රාජ්‍ය නායකයා ද ආණ්ඩුවේ නායකයාද ජනාධිපති ය.
* විධායකය ව්‍යවස්ථාදායකයට වග නොකිය යි.
* ව්‍යවස්ථාදායකය මගින් ඍජුව විධාකය පාලනය නොකරයි.

(iii) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය

(4) (i) මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම වේ.

(ii) ආර්ථික බලය, දේශපාලන බලය, සමාජ බලය

(iii) පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය

(5) (i) ඡන්ද දායකයාට නිදහසේ තමන් කැමති දේශපාලන පක්ෂයකට හෝ කණ්ඩායමකට සහාය ලබාදීමටත් ඡන්දය ප්‍රකාශ කිරීමටත් අවස්ථාව තිබීම.

(ii) නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම
මැතිවරණ නීතිරීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම
සාමකාමී වාතාවණයක් තුළ මැතිවරණ පැවැවීම (ආදී වශයෙන් පි. 10)

(iii) **<u>A අයිතිවාසිකම්</u>**

* ඡන්දය පාවිච්චි කිරීම
* මැතිවරණ රැස්වීම් වලට සහභාගී වීම.
* මැතිවරණ ප්‍රචාරක රැස්වීම් ඇමතීම
* කැමති පක්ෂයකට බැඳීම
* මැතිවරණ වලට ඉදිරිපත් වීම ආදී වශයෙන්

**<u>B යුතුකම්</u>**

* ඡන්දය දැමීම
* මැතිවරණ නීතිරීති උල්ලංඝනය නොකිරීම
* සාමකාමීව මැතිවරණ කටයුතුවල නිරත වීම

(6) (i) ආගම, භාෂාව, ඇඳහිලි, ඇඳුම් පැළඳුම්, කලාව, අධ්‍යාපනය, උපකරණ, විශ්වාස, ඇගයීම් ආදී වශයෙන්

(ii)
* විවිධ ජන වර්ග, භාෂා කථා කරන, ආගම් අදහන පුද්ගලයින් එකට ජීවත්වීම
* ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත් විරිත් ආචාර ධර්ම, ඇගයීම් පද්ධතියක් තිබීම.
* එක ජන කොටසක වුවද ප්‍රාදේශීය විවිධත්වයන් තිබීම (ආදී වශයෙන් පිටුව 59)

(iii) පිළිතුරට අනුව

(7) (i)
* දූෂණයෙන් හා වංචාවෙන් තොර රාජ්‍ය පාලනය
* නිදහස සහ සාධාරණත්වය තහවුරු කිරීම
* නීතියේ ආධිපත්‍ය හා අධිකරණයේ ස්වාධීනත්වය (ආදී වශයෙන් පි. 64)

(ii)
* විවිධ ජනවර්ග අතර විශ්වාසය තහවුරු වීම.
* එකිනෙකා අතර අවබෝධය පුළුල් වීම.
* නීති ගරුක පුරවැසියන් ලෙස ජීවත් වීමට හුරුවෙයි
* විනිවිද භාවයෙන් කටයුතුකරයි
* සහජීවනයෙන් කටයුතු කරයි.

(iii)
* අන්‍ය ආගම් වලට අවමන් නොකිරීම
* එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනාගෙන අවබෝධයෙන් එකිනෙකාට ගරුකරමින් කටයුතු කිරීම
* අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
* සාමූහිකත්වය වර්ධනය කිරීම
* අනෙකුත් භාෂා ඉගෙනීම හා භාවිතය
* අන්‍ය මත ඉවසීම (පි. 60)